# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

**කොමිෂන් සභා චක්‍රලේඛ අංක : 919**

අංක: 20, වෝඩ් පෙදෙස,
කොළඹ 07.

2010 ජනවාරි 15.

විශ්වවිද්‍යාල උපකුලපතිවරු
මණ්ඩපාධිපතිවරු
ආයතන අධ්‍යක්ෂකවරු

විශ්වවිද්‍යාලයන්හි හෝ උසස් අධ්‍යාපන ආයතනයන්හි නවකවදය නැමති තර්ජනය මැඩ පැවැත්වීම සඳහා හඳුන්වා දීමට නියමිත මාර්ගෝපදේශ.

---

ඈත අතීතයේ සිටම ලොව පුරා විශ්වවිද්‍යාල පද්ධතියේ ශිෂ්‍යයන් අතර හොඳ හිත සහ දැන හඳුනා ගැනීම වැඩි දියුණු කිරීම සඳහා නවකවදය පැවතිණි. එහෙත් මෙයට ප්‍රතිවිරුද්ධව ශ්‍රී ලාංකාවේ විශ්ව විද්‍යාලයන්හි බියජනක ලෙස නිත්‍ය කායික සහ/ හෝ මානසික අබාධිත තත්වයන් ඇතිකල හෝ සිසුන් කීප දෙනෙකුට මරණය ලගා කර දුන් උග්‍ර කායික සහ මානසික වධ හිංසා නවකවදයෙන් සිදුවී ඇත. එසේම බොහෝ අවස්ථා වලදී නවකවදය යනු තෝරා ගත් ශිෂ්‍ය කණ්ඩායමකට හෝ පංතියකට වධ හිංසා පැමිණවීමට හෝ නවක සිසුන් වෙත විවිධ දේශපාලන මතවාදයන් කා වැද්දවීම අරමුණු කර ගනිමින් හිතාමතාම සිදුකරන සංසිද්ධියක් බවට පත් වී ඇත. සමස්ථයක් වශයෙන් ගත් කල අහිතකර සිද්ධීන් හා විශේෂයෙන්ම ජීවිත තර්ජන, නවකවදය ප්‍රවර්ධනය කරන්නන් විසින් පවසනු ලබන සමාජානු ගතකිරීම හෝ ස්ථානුකූලනය අභිභවා යයි. නවකවදය හා ඒ හා සහසම්බන්ධ සුලභ සිදුවීම් සමග බැඳී ඇති මැසිවිලි බොහෝ විට දක්නට ඇත්තේ උසස් අධ්‍යාපන ආයතනයන්ට නවක සිසුන් ලියා පදිංචි වන සමයේදීය. එබැවින් 1998 වර්ෂයේදී, **"1998 අංක 20 දරන අධ්‍යයන ආයතනවල නවකවදය හා වෙනත් ස්වරූපයේ සාහසික ක්‍රියා තහනම් කිරීමේ පනත"** හඳුන්වා දෙන ලදී. එකී පනත අනුව, **නවකවදය යනු අධ්‍යාපන ආයතනයක ශිෂ්‍යයෙකුට හෝ කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙකුට ශාරීරික හෝ මානසික හානියක් හෝ මානසික වේදනාවක් හෝ බියක් ඇති කරන හෝ එසේ ඇති කිරීමට ඉඩ ඇති යම් ක්‍රියාවකි.**

<u>නවකවදයේ ස්වරූපයන්</u>

අධ්‍යාපන ආයතනයක් තුළ හෝ ඉන් පිටදී නවකවදය සිදුකරන්නා මෙම පනත යටතේ වරදකරුවෙකු වේ.

අ) යම් ශිෂ්‍යයෙකුට හෝ කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙකුට නවකවදය සිදුකරන විට ලිංගික අතවරයක් හෝ බරපතල තුවාල කිරීමක් සිදුකරන ඕනෑම තැනැත්තෙකු,

ආ) අධ්‍යාපන ආයතනයක යම් ශිෂ්‍යයෙකු හෝ කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙකු හෝ තුල බිය ඇති කිරීමේ චේතනාව ඇතිව හෝ තර්ජිත තැනැත්තාට නීතියෙන් නියම කර නොමැති යම් ක්‍රියාවක් කරන ලෙස හෝ කිරීමට ඒ තැනැත්තාට අයිතිය තිබෙන යම් ක්‍රියාවක් නොකරන ලෙස හෝ තර්ජිත තැනැත්තාට බල කිරීමේ චේතනාව ඇතිව ඒ අධ්‍යාපන ආයතනය තුළදී හෝ ඉන් පිටතදී හෝ ඒ ශිෂ්‍යාගේ හෝ කාර්ය මණ්ඩලයේ සාමාජිකයාගේ ශරීරයට, කීර්තියට හෝ දේපළට, තර්ජිත තැනැත්තාට සම්බන්ධතාවයක් ඇති වෙනත් යම් තැනැත්තෙකුගේ ශරීරයට, කීර්තියට හෝ දේපළට හානි සිදු කරන බවට, වාචිකව හෝ ලිඛිතව තර්ජනය කරන්නාවූ යම් තැනැත්තෙකු,

ඇ) යම් අධ්‍යාපන ආයතනයක් ඇතුලත දී හෝ ඒ අධ්‍යාපන ආයතනයේ කළමණාකරණය හා පාලනය යටතේ වූ යම් පරිශ්‍රයක් ඇතුළතදී නිත්‍යානුකුල යුක්ති සහගත භාවයකින් තොරවද, යම් විශේෂ ක්‍රියා මාර්ගයක් ගැනීමට ඒ අධ්‍යාපන ආයතනයේ යම් ශිෂ්‍යයෙකුට, එහි කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට හෝ වෙනත් තැනැත්තෙකුට බල කිරීමේ කාර්යය සඳහාද, ඒ ශිෂ්‍යයාගේ හෝ කාර්ය මණ්ඩලයේ සාමාජිකයාගේ හෝ වෙනත් තැනැත්තකුගේ හෝ පෞද්ගලික නිදහස සහ යාම ඊමේ නිදහස අවහිර කරන්නාවූ යම් ක්‍රියාවක් කරන යම් තැනැත්තෙකු,

ඈ) අධ්‍යාපන ආයතනයක යම් ශිෂ්‍යයකු හෝ කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙකු ඇතැම් පරිමිත සීමා වලින් ඔබ්බට යාම වලක්වාලන යම් ආකාරයකින් ඒ ශිෂ්‍යයාට හෝ සාමාජිකයාට නීති විරෝධී ලෙස අවහිර කරන යම් තැනැත්තකු,

ඉ) අධ්‍යාපන ආයතනයකට අයත්වන්නා වූ හෝ එහි කළමණාකරණය හෝ පාලනය යටතේ පවත්නා හෝ යම් පරිශ්‍රයක, නිත්‍යානුකූල හේතුවක් නොමැතිව, බලහත්කාරයෙන් පදිංචි වන්නා වූ යම් තැනැත්තෙකු,

ඊ) අධ්‍යාපන ආයතනයකට අයත්වන්නා වූ හෝ එහි කළමණාකරණය හෝ පාලනය යටතේ පවත්නා යම් දේපළක් සම්බන්ධයෙන් අනර්ථයක් සිදුකරන යම් තැනැත්තෙකු.

පසුගිය දශකයේ දී විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන විසින් ඉහත සඳහන් පනතින් පවරන ලද බලතල උපයෝගී කොට ගනිමින් නවකවදය මැඩලීමට පියවර ගෙන නොමැති බව නිරීක්ෂණය වූ අතර එය හේතු කොට ගෙන විශේෂයෙන්ම නවක සිසුන් අතරත් මහජනයා අතරත් ඉමහත් අවධානයක් හා ආන්දෝලනයක් ඇති විය.

1998 දී හඳුන්වා දෙන ලද ඉහත සඳහන් පනත තිබියදීත් මෑත අතීතයේදී විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන වල විවිධ මුහුණුවරින් යුත් නවකවද සිද්ධීන් බිය උපදවන අන්දමින් ඉහලයන වග වාර්තා වීම සහ නිරීක්ෂණය වීම නිසා එම පනතේ විධිවිධාන දැඩි ලෙස කඩිනමින් ක්‍රියාත්මක කිරීමට හැකිවනු පිණිස පහත සඳහන් මාර්ගෝපදේශ පිළියෙල කරන ලදී. එබැවින් ඒ ඒ විශ්ව විද්‍යාලය/උසස් අධ්‍යාපන ආයතනය සකස් කරගෙන ඇති ක්‍රම වේදයන්ට / අතුරු ව්‍යවස්ථාවලට අමතරව නිවාරණය, ක්‍රියාත්මක කිරීම සහ දඬුවම් දීම යන පියවර තුන අනුව විශ්ව විද්‍යාල/ උසස් අධ්‍යාපන ආයතන කටයුතු කල යුතුය.

1. <u>නිවාරණය</u>

1.1 උසස් අධ්‍යාපන ආයතනයක ලියා පදිංචි වී සිටින කාල පරිච්ඡේදය තුළ, එම පරිශ්‍රය තුළ හෝ ඉන් පිටතදී කිසිදු ආකාරයේ නවකවදය හෝ වෙනත් ස්වරූපයේ සාහසික ක්‍රියාවන් ආරම්භ නොකරන බවටත්, එවැනි ක්‍රියාවන්ට ආධාර නොකරන බවටත්, ක්‍රියාවෙහි නොයොදවන බවටත් ප්‍රකාශ කරමින් දෙමාපියන් /භාරකරුවන් විසින් අනු අත්සන් තබන ලදුව ශිෂ්‍යයන් විසින් ප්‍රකාශනයකට අත්සන් තැබිය යුතුය. (ඇමුණුම I හි ආකෘතිය)

1.2 ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/ සහකාර ලේඛකාධිකාරී ( ශිෂ්‍ය ශුභසාධන) කැඳවුම්කරු ලෙස කටයුතු කරන උපකුලපති තුමා සහ/ හෝ නියෝජ්‍ය උප කුලපතිතුමා, පීඨාධිපතිවරු, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නම්කරනු ලැබූ පාලක සභා සාමාජිකයන් අතුරින් එක් සාමාජිකයෙක්, විනය පාලකවරයෙකු සිටී නම් ඔහු, විශ්වවිද්‍යාල වෛද්‍ය නිලධාරී, ශිෂ්‍ය උපදේශකවරු සහ නේවාසිකාගාර උප පාලකවරුන්ගෙන් සමන්විත නවකවදය පිටුදැකීමේ කමිටුවක් පත් කිරීම. නවකවදය ප්‍රාරම්භක අවස්ථාවේ සහ උච්ච අවස්ථාවන්හිදී මෙම කමිටුව අවම වශයෙන් මසකට දෙවරක් රැස් විය යුතු අතර නිරන්තරයෙන් පාලක සභාවට වාර්තා කළ යුතුය. ඒ ඒ විශ්ව විද්‍යාලයේ /උසස් අධ්‍යාපන ආයතනයේ අවශ්‍යතා මත පීඨ මට්ටමේ නවකවදය පිටු දැකීමේ කමිටු පත් කිරීම උනන්දු කරවිය යුතුය.

1.3 ඉහත සඳහන් පනතේ විධිවිධාන මත නවකවදය ලෙස ගිණිය හැකි ක්‍රියාවක් සහ ඊට අදාලව දිය හැකි දඬුවම් ඇතුලත් සවිස්තර අත්පත්‍රිකාවක් පිළියෙල කල යුතුය.

1.4 ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය හෝ ඊට ඉහල මට්ටමේ අධ්‍යයන කාර්යය මණ්ඩල සමාජිකයන් තාවකාලික ශිෂ්‍ය උපදේශකවරු ලෙස මාස තුනක හෝ ඊට වැඩි කාල පරිච්ඡේදයක් සඳහා පත් කළ යුතු අතර එක් තාවකාලික උපදේශකවරයෙකුට ශිෂ්‍යයන් 20 -25 ත් අතර සංඛ්‍යාවකට නොවැඩි පිරිසක් පැවරීම කල යුතුය.

1.5 පනතේ විධිවිධාන අන්තර්ගතවන පරිදි නවකවදයේ සෑම අංශයක්ම පිළිබඳව සෑම අංශ ප්‍රධානියෙක්ම සහ අනෙකුත් වගකිව යුතු ඒකක ප්‍රධානියෙක්ම දැනුවත් කළ යුතුය.

1.6 නවකවදය හා සම්බන්ධව ගෙන ඇති සෙසු ක්‍රියා මාර්ග දැක්වෙන දැන්වීම් පුස්තකාල, ශිෂ්‍ය ආපන ශාලා, නේවාසිකාගාර සහ අදාල දැන්වීම් පුවරු ආදී ප්‍රමුඛ ස්ථාන වල ප්‍රදර්ශනය කල යුතුය.

1.7 නවකවදය වැලැක්වීම සම්බන්ධව ගෙන ඇති ක්‍රියා මාර්ග පිළිබඳව ආරක්ෂක කාර්ය මණ්ඩල දැනුවත් කල යුතුය.

1.8 පනතේ ලක්ෂණ පිළිබඳව දෙමාපියන් හා නවක සිසුන් දැනුවත් කල යුතුය.

1.9 නවකවදයේ ප්‍රතිවිපාක පිළිබඳව ජ්‍යෙෂ්ඨ සිසුන් දැනුවත් කල යුතුය.

1.10 ජ්‍යෙෂ්ඨ සිසුන්ගේ නිවාඩු කාලය තුල නවක සිසුන් ඇතුලත් කිරීම කල යුතුය.

1.11 කිසියම් ආකාරයක නවකවදයකට භාජනය වුවහොත් යා යුතු උපාය මාර්ගික ස්ථාන සහ ගත යුතු ක්‍රියාපටිපාටි පිළිබඳව නවක සිසුන් දැනුවත් කිරීමේ නම්නීකරණ / හුරුකරවීමේ වැඩසටහන් පැවැත්විය යුතුය.

1.12 පැය 24 පුරාම උසස් අධ්‍යාපන ආයතනය තුළ හා තදාසන්න ප්‍රදේශයේ සුපරීක්ෂාකාරී ක්‍රියාකාරකම් සඳහා අදාල සියලු නිලධාරීන් කාර්යාලයේ වැඩ කරන වේලාවෙන් පසුව සහ සති අන්තයේදී පැමිණෙන ලෙස උනන්දු කල යුතුය.

1.13 නවකවදය ආශ්‍රිත ක්‍රියාකාරකම් ඇති විය හැකි ස්ථාන හෝ කාල පරිච්ඡේදයන් පිළිබඳව ප්‍රදේශයේ පොලිසිය දැනුවත් කර තැබිය යුතුය.

1.14 නවකවදය මැඩලීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව ජන මාධ්‍ය දැනුවත් කිරීම සහ විශේෂයෙන් ම ආයතනයේ වටාපිටාව ඉලක්ක කර ගනිමින් පොදු ජනයා දැනුවත් කල යුතුය.

1.15 ස්වේච්ඡා පදනමින් හෝ රාජකාරී ලේඛණයක් පදනම්කරගෙන ශිෂ්‍ය උපදේශකවරු සහ නේවාසිකාගාර උප පාලකවරුන් විශ්වවිද්‍යාල පරිශ්‍රය තුල වැඩි කාලයක් රැඳී සිටීමට උනන්දුකර විය යුතුය.

1.16 විශ්වවිද්‍යාල වටපිටාවට සහ සංස්කෘතියට නවක සිසුන් හුරුකරවීම සඳහා වඩා ආරක්ෂාකාරී සහ ශිෂ්‍ය හිතෛෂී වටපිටාවක් ලබා දිය හැකි ආකාරයේ නව්‍ය වැඩ සටහන් හෝ ක්‍රියාකාරකම් ආරම්භ කල යුතුය.

2. <u>නවකවදය අවස්ථාවකදී අනුගමනය කල යුතු ක්‍රියා පිළිවෙල</u>

2.1 නවකවදය හා සම්බන්ධ සියළු පැමිණිලි වාර්තාගතකිරීම සහ ප්‍රසිද්ධියේ පැමිණිළි ඉදිරිපත් කිරීමට හෝ අවශ්‍ය නම් රහසිගත ලෙස පැමිණිළි ඉදිරිපත් කිරීමට පහසුකම් සැලසීම .

2.2 හැකි තරම් ලිඛිත පැමිණිලි, භෞතික සාක්ෂි, තුවාල වීම්,සවිස්තරාත්මක සාක්ෂි, පටිගත කරන ලද (ශ්‍රව්‍ය) සහ ඡායාරූප හෝ දෘෂ්‍ය සාක්ෂි සැපයීම සඳහා සාක්ෂිකරුවන් උනන්දු කරවීම.

2.3 1998 අංක 20 දරන නවකවදය පනත ප්‍රකාර කටයුතු කිරීම සඳහා සියලුම නවකවද සිද්ධීන් අදාල පොලිස් ස්ථානයට වාර්තා කිරීම.

2.4 වෛද්‍ය හෝ මානසික පරීක්ෂණයකට භාජනය කිරීම සහ අවශ්‍ය නම් ඒවායේ වාර්තා ලබා ගැනීම.

2.5 දණ්ඩ නීති සංග්‍රහයේ සහ 1994 අංක 22 දරණ වධදීම, කෲර අමානුෂික හෝ නින්දිත සැලකුම් හෝ දඬුවම් වලට එරෙහි වූ සම්මුතියේ විධිවිධාන ප්‍රකාර බරපතල තුවාල සිදුකළ හෝ දඬුවම් කළ හැකි ආකාරයේ ක්‍රියාවකදී පොලිසියට වාර්තා කිරීම.

2.6 නවකවදය හේතුවෙන් විශ්වවිද්‍යාල හෝ පොදු දේපල හානි සිදුවීම් පිළිබඳ තොරතුරු ලබා ගැනීම.

2.7 1998 අංක 20 දරණ නවකවදය තහනම් කිරීමේ පනතේ ක්‍රියා පටිපාටිය අනුගමනය කිරීම.

2.8 1998 අංක 20 දරන නවකවදය පනත ප්‍රකාර නවක සිසුන් ලියා පදිංචි වූ පළමු මාස තුන තුළ සතිපතා, නවක වදය හා සම්බන්ධ සියළුම සිදුවීම් සහ රට නියම කල දඬුවම් පිළිබඳව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට වාර්තා කිරීම.

3. දඬුවම්

ඉහත කී පනතේ සඳහන් බොහොමයක් අපක්‍රියා ඇප ලබා දිය නොහැකි වරද වන අතර වසර 10 ක් දක්වා බරපතල සිර දඬුවම් ලබා දිය හැකි මට්ටමේ ඒවා බව අවධාරණය කර ඇත. එසේම ඉහත කී පනත ප්‍රකාර, යම් ශිෂ්‍යයෙක් වරදකරු වුයේ නම් ආයතනයෙන් නෙරපිය හැකි අතර රට ගොදුරු වූ තැනැත්තාට ශාරීරික හෝ දේපළ හානි සිදු වුයේ නම් ඒ සඳහා වන්දි ගෙවිය යුතුයි.

මහාචාර්ය ගාමිණී සමරණායක
සභාපති

පිටපත් :
1. සභාපති කාර්යාලය/වි.වි.ප්‍ර.කො.ස
2. උප සභාපති කාර්යලය/වි.වි ප්‍ර.කො.ස
3. වි.වි.ප්‍ර.කො.ස සාමාජිකයන්
4. ලේකම්/ වි.වි ප්‍ර.කො.ස
5. පීඨාධිපතිවරු
6. විශ්වවිද්‍යාල ලේඛකාධිවරු
7. මුල්‍යපාලක/ වි.වි ප්‍ර.කො.ස
8. විශ්වවිද්‍යාල මුල්‍යාධිකාරීවරු
9. පුස්ථකාලාධිපතිවරු/උසස් අධ්‍යාපන ආයතන /ආයතනවල ජේ.ස.පු/ස.පු
10. මණ්ඩප/ආයතන වල නියෝජ්‍ය ලේඛකාධිකාරීවරු/ජේ.ස.ලේ/ස.ලේ
11. මණ්ඩප/ආයතන වල නියෝජ්‍ය මුල්‍යාධිකාරීවරු/ජේ.ස.මු/ස.මු
12. ප්‍රධාන අභ්‍යන්තර විගණක / වි.වි ප්‍ර.කො.ස
13. විශ්වවිද්‍යාලයන්හි රජයේ විගණන අධීක්ෂකවරු
14. උසස් අධ්‍යාපන ආයතනයන්හි ජේ.ස අභ්‍යන්තර විගණක/ස.අ.වි
15. වෘත්තීය සමිති ලේකම්වරු
16. විගණකාධිපති

UGC/L/749

ප්‍රකාශනයේ ආකෘතිය

ඉල්ලුම්කරු හෝ ශිෂ්‍යයාගේ ප්‍රකාශය.

1) ............................................ වන මා විසින් 1998 අංක 20 දරන අධ්‍යාපන ආයතන වල නවකවදය සහ වෙනත් ස්වරූපයේ සාහසික ක්‍රියා තහනම් කිරීමේ පනතේ දක්වා ඇති නවකවදය තහනම් කිරීමේ නීති සහ 2010 ජනවාරි 15 දින දරන කොමිෂන් සභා චක්‍රලේඛ අංක ............ සැලකිල්ලෙන් කියවා තේරුම් ගතිමි.

2. මම මින්;

2.1 නවක වදය යන අර්ථකථනය යටතට ගැනෙන කිසිදු හැසිරීමක හෝ ක්‍රියාවක නිරත නොවන බවටත්

2.2 කිසිදු ආකාරයක නවකවද ක්‍රියාවකට සහභාගීවීමක හෝ අනුබල දීමක හෝ ප්‍රචාරය කිරීමක නිරත නොවන බවටත්

2.3 කිසිදු පුද්ගලයෙකුට ශාරීරිකව, මානසිකව හෝ වෙනත් හිංසාකාරී ක්‍රියාවක නිරත නොවන බවටත් සහතික වෙමි.

3) ඕනෑම ආකාරයේ නවකවද ක්‍රියාවක නිරතවී වැරදිකරු වුවහොත් බලපවත්වනු ලබන නීති සහ විශ්ව විද්‍යාලයේ අතුරු ව්‍යවස්ථා අනුව දඬුවම් ලැබිය හැකි බවට එකග වෙමි.

.........................වර්ෂයේ .............................මාසයේ .....................දින අත්සන් තබන ලදි.

.............................
ශිෂ්‍යාගේ අත්සන

නම.........................................................
ප්‍රවේශ අංකය ............................................
ලිපිනය ..................................................
..................................................
..................................................

<u>දෙමව්පියන්/භාරකරුවන්ගේ පොරොන්දුව</u>

1. ..................................................... වන මා විසින් 1998 අංක 20 දරන අධ්‍යාපන ආයතන වල නවක වදය සහ වෙනත් ස්වරූපයේ සාහසික ක්‍රියා තහනම් කිරීමේ පනතේ දක්වා ඇති නවකවදය තහනම් කිරීමේ නීති සහ 2010 ජනවාරි 15 දින දරන කොමිෂන් සභා චක්‍රලේඛ අංක ........................ සැලකිල්ලෙන් කියවා තේරුම් ගතිමි.

2. මාගේ පුතා/දියණිය/රක්ෂිතයා කිසිදු ආකාරක නවකවදය සම්බන්ධ ක්‍රියාවක නිරත නොවන බවට සහතික වෙමි.

3. ඔහු හෝ ඇය විසින් කිසියම් ආකාරයක නවකවදය සම්බන්ධ ක්‍රියාවක නිරත වී වරදකරු වුවහොත් ඔහු හෝ ඇය බලපවත්වනු ලබන නීති සහ විශ්වවිද්‍යාල අතුරු ව්‍යවස්ථා අනුව දඬුවම් ලැබිය හැකි අයකු බවට එකග වෙමි.

.....................................
දෙමව්පිය/භාරකරු අත්සන

නම : ..............................................................
ශිෂ්‍යාට ඇති සම්බන්ධතාවය: .........................................
ලිපිනය:...........................................................
..............................................................
..............................................................